# ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

"නිපුණතා පියස", 4 වන මහල, 354/2, ඇල්විටිගල මාවත, නාරාහේන්පිට, කොළඹ 05

දුරකථන අංක 011-2598220

දිනය - 2026.09.17

කළමනාකරු

**භාණ්ඩ ප්‍රවාහනය සඳහා කුලී පදනම මත ලොරි රථ ලබා ගැනීම**

අප ආයතනයේ පුහුණු උපකරණ ප්‍රවාහනය සඳහා කුලී පදනම මත ලොරි රථ ලබා ගැනීමට මිල ගණන් කැඳවනු ලැබේ. ඔබ ආයතනයේ මුද්‍රා තබන ලද මිල ගණන් පහත සඳහන් කරුණු සැලකිල්ලට ගෙන සම්පූර්ණ කරන ලද ලංසු ලේඛන **2026.09.25** දින පෙ.ව. **10.30**ට පෙර ඉහත ලිපිනයෙහි සඳහන් ප්‍රසම්පාදන ඒකකයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය හැක. මිල ගණන් බහාලන කවරයේ වම් පස"**VTA/PROC/Service/TF/SM/2026/40/Rent for Lorry**" සඳහන් කළ යුතුය. ලංසු විවෘත කිරීම 2026.09.25 දින පෙ.ව. 10.30ට ඔබ හෝ ඔබ විසින් නම් කරන ලද බලයලත් නියෝජිතයකු ඉදිරිපිටදී එම ස්ථානයේදීම සිදු කිරීමට සැලසුම් කර ඇත.

**මිල ගණන් ඉදිරිපත් කිරීමේදී සැලකිල්ලට ගත යුතු විශේෂ කොන්දේසි**

**1.වාහනයේ තත්ත්වය**
- හොඳ යාන්ත්‍රික තත්ත්වයක තිබිය යුතුය.
- එන්ජිම, Gearbox, Clutch, Brake, Steering සහ Suspension පද්ධති නිසි ක්‍රියාකාරී තත්ත්වයේ තිබිය යුතුය.
- අනතුරුදායක/අබලන් තත්ත්වයේ වාහන භාවිතා නොකළ යුතුය.
- වාහනය පිරිසිදුව හා භාණ්ඩ ප්‍රවාහනයට සුදුසු තත්ත්වයේ තිබිය යුතුය.

**2. වාහනයේ ලියාපදිංචිය**
- ශ්‍රී ලංකා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ නීත්‍යානුකූලව ලියාපදිංචි කර තිබිය යුතුය.
- වලංගු ආදායම් බලපත්‍රයක් තිබිය යුතුය.
- වලංගු රක්ෂණ ආවරණයක් තිබිය යුතුය.
- අදාළ වාහන බලපත්‍ර/යෝග්‍යතා සහතික තිබිය යුතුය.

**3. රියදුරු**
- සේවා සැපයුම්කරු විසින් සුදුසු වලංගු බර වාහන රියදුරු බලපත්‍රයක් සහිත පළපුරුදු රියදුරෙකු ලබා දිය යුතුය.

**4. සේවා ලබාදෙන ආකාරය**
- ආයතනයේ ඉල්ලීම මත නියමිත දිනය හා වේලාවට ලොරි රථය ලබා දිය යුතුය.

**5. ධාවන ප්‍රදේශය**
- ශ්‍රී ලංකාව තුළ ආයතනය විසින් දැනුම් දෙන ස්ථාන වෙත භාණ්ඩ ප්‍රවාහනය කිරීම

**6. ඉන්ධන**
- මිල ගණන් ඉදිරිපත් කිරීමේදී ඉන්ධන වියදම ඇතුළත් විය යුතුය.

**7. රියදුරු ගාස්තු**
- රියදුරු වැටුප්/දීමනා මිල ගණන්වලට ඇතුළත් විය යුතුය.

**8.** නඩත්තු හා අලුත්වැඩියා

- වාහනයේ නඩත්තු, අලුත්වැඩියා සහ සාමාන්‍ය මෙහෙයුම් වියදම් සේවා සැපයුම්කරු විසින් දැරිය යුතුය.

**9.** බිඳ වැටීම **(Breakdown)** අවස්ථාවකදී

- වාහනය ගමන අතරතුර අක්‍රිය වුවහොත් හැකි ඉක්මනින් වෙනත් සමාන ධාරිතාවයක ලොරි රථයක් ලබා දීමට සැපයුම්කරු කටයුතු කළ යුතුය.

**10.** මයිලෝමීටර වාර්තා

- ආයතනයේ ඉල්ලීම මත නියමිත දිනයට මයිලෝමීටර සහ කිලෝ මීටර් ගණන ඉදිරිපත් කළ යුතුය.

**11.** ගිවිසුමේ වලංගු කාලය.

- ගිවිසුමේ වලංගු කාලය මාස තුනක් විය යුතුය.

<u>**මිල ගණන් ඉදිරිපත් කිරීමේදී සැලකිල්ලට ගත යුතු කරුණු**</u>

1. ඔබ විසින් ඉදිරිපත් කරන ලද මිල ගණන් දින 30ක කාලයක් සඳහා වලංගු විය යුතුය.
2. දුරකථනයෙන් දැනුම් දී පැය 02 ක් ඇතුළත ප්‍රධාන කාර්යාලයට පැමිණිය යුතුය
3. රිය සහයකු ඔබ විසින් සපයා ගත යුතුය.
4. සභාපති, ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය, නිපුණතා පියස", 4 වන මහල, 354/2, ඇල්විටිගල මාවත, නාරාහේන්පිට, කොළඹ 05 යන ලිපිනයට මිල කැඳවුම ඉදිරිපත් කළ යුතුය.

සහකාර අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන)

| අංකය | අයිතමය | ප්‍රමාණය | ඒකකයක වටිනාකම (කි.මී. 1 සඳහා) | බදු | මුළු වටිනාකම |
|---|---|---|---|---|---|
| 01 | අඩි20 ප්‍රමාණයේ කන්ටේනර් වර්ගය | 02 | | | |
| 02 | අඩි14.5 - 15 ප්‍රමාණයේ ආවරණය කරන ලද ලොරි | 01 | | | |
| 03 | අඩි10.5 ප්‍රමාණයේ ලොරි | 01 | | | |

**දිනය :** **අත්සන සමඟ මුද්‍රිව:**